පාලි යතුර

1 ශ්‍රේණිය



රාජකීය පණ්ඩිත පදියතලාවේ ඤාණවිමල හිමි

ශ්‍රී විද්‍යානන්ද පිරිවෙණ
යල්කුඹුර - බිබිල

077 8438417
070 6438417

WWW.PIRIVENA.lk

පාලි 01

01.1

1. පාලි හෝඩියේ අකුරු කීය ද? 41කි. (අකබරාපාදයො එකචත්තාළීසං

2. පාලි හෝඩිය කොටස් කීයකට බෙදේ ද? 2කි.

3. ස්වර අකුරු කීය ද? 8කි (තත්‍ථොදන්තා සරා අට්ඨ)

4. ව්‍යඤ්ජන අකුරු කීය ද? 33කි. (සෙසා බ්‍යඤ්ජනා)

5. පහත දැක්වෙන ඡේදය පිටපත් කරන්න.

එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

6. ඔබ විසින් පිටපත් කරන ලද ඡේදයේ තනි ව යෙදී ඇති ස්වර අකුරු යටින් ඉරක් අඳින්න.

7. පාලි අක්ෂර මාලාව නිවැරදි ව ශබ්ද නගා උච්චාරණය කරන්න.

8. එම අකුරු ස්වර ව්‍යඤ්ජන වශයෙන් වෙන වෙන ම මතකයෙන් කියන්න.

WWW.PIRIVENA.lk

02. 1

1. මේ අකුරු එකතු කර ලියන්න.

1. ග් + අ - ග 2. ජ් + ඉ - ජි

3. ඩ් + උ - ඩු 4. ද් + එ - දෙ

5. බ් + ඔ - බො

2. මේ අකුරුවල ස්වර ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

1. ම - ම් +අ 2. පා - ප් + ආ

3. සී- ස් + ඊ 4. රූ -ර් + ඌ

5. ති - ත් + ඉ

3. පහත දැක්වෙන අකුරු එකට බැඳ ලියන්න.

1. ම්ම - මම 2. ස්මි - සමි 3. ද්ධ - දධ

4. ප්ඵ - පඵ 5. ත්ත - තත 6. ස්සා - සසා

7. ක්ක - කක 8. ග්ඝො - ගඝො 9. ට්ඨො - ටඨො

10. ණ්ඨෙ - ණඨෙ

4. පහත දැක්වෙන පාලි වචන බැඳි අකුරෙන් ලියන්න.

1. අස්සො - අශ්වයා - අසසො

2. ඉස්සරො - අධිපතියා - ඉසසරො

3. කච්ඡපො - ඉබ්බා - කචඡපො

4. චන්දො - සඳ - චනදො

5. පණ්ඩිතො - පඬිවරයා - පණඩිතො

WWW.PIRIVENA.lk

6. බුද්‍ධො - බුදුරජ - බුද්ධො

7. බන්‍ධුලො - බන්ධුල - බන්ධුලො

8. රුක්‍ඛො - ගස - රුක්ඛො

5. පහත සඳහන් බැඳි අකුරු වෙන් කර ලියන්න.

1. ඩ්‍ඩ - ඩ්ඩ   2. ක්‍කෙ - ක්කෙ

3. ස්‍සො - ස්සො   4. ග්‍ගො - ග්ගො

5. ළ්‍හො - ළ්හො

6. සම්මෝදමාන ජාතක කතාවෙහි දැක්වෙන පාලි ඡේදය නිවැරදි ව කියවන්න.

7. එම ඡේදය පිටපත් කරන්න.

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො වට්ටක යොනියං නිබ්බත්තිත්වා අනෙකවට්ටක සහස්සපරිවාරො අරඤ්ඤෙ පටිවසති. තදා එකො වට්ටකලුද්දකො තෙසං වසනට්ඨානං ගන්ත්වා වට්ටකවස්සිතං කත්වා තෙසං සන්නිපතිතභාවං ඤත්වා තෙසං උපරි ජාලං ඛිපිත්වා පරියන්තෙසු මද්දන්තො සබ්බෙ එකතො කත්වා පච්ඡිං පූරෙත්වා ඝරං ගන්ත්වා තෙ වික්කිණිත්වා තෙන මූලෙන ජීවිකං කප්පෙති.

8. ඔබ පිටපත් කළ ඡේදයේ ඇති බැඳි අකුරු රවුම් කර පෙන්වන්න.

WWW.PIRIVENA.lk

03. 1

1. පාලි භාෂාවේ පද වර්ග නම් කරන්න.

    නාම පද, ක්‍රියා පද, නිපාත පද, උපසර්ග පද

2. නාම පද හා ක්‍රියා පද පහ බැගින් ලියන්න.

    නාම පද : බුද්ධො, රුක්ඛො, ඵලං, චන්දො, විහාරං

    ක්‍රියා පද : ඛාදති, රක්ඛති, සයති, චරති, වහති, පචති

3. පාඩම කියවා එහි ඇති ක්‍රියා පද පහක් ලියන්න.

    ආහ, පාපෙති, ජානාමි, සක්ඛිස්සති, පක්ඛිපථ, පටිස්සුණිංසු

WWW.PIRIVENA.lk

04. 1

1. පාඩමේ දී ඇති පාලි ඡේදයේ ඉරි ඇඳි පදවල විභක්ති ලියන්න.

බොධිසත්තෙන - තතියා විභක්තිය

එකස්මිං - සත්තමි විභක්තිය

සාකුණිකස්ස - ඡට්ඨී විභක්තිය

වට්ටකා - පඨමා විභක්තිය

ගෙහං - දුතියා විභක්තිය

2. පහත සඳහන් වචනවල බහුවචන දක්වන්න.

1. බුද්ධස්ස - බුද්ධානං
2. බුද්ධං - බුද්ධෙ
3. බුද්ධම්හි - බුද්ධෙසු
4. චොරො - චොරා
5. වාණිජම්හා - වාණිජෙහි

3. මේ පදවල අර්ථ ලියන්න.

1. හෙ බුද්ධ - පින්වත් බුදුරජ
2. බුද්ධස්ස - බුදුරජුට, බුදුරජුගේ
3. බුද්ධා - බුදුරජ
4. බොධිසත්තෙන - බෝධිසත්ත්වයන් විසින්
5. වට්ටකා - වටුවෝ

WWW.PIRIVENA.lk

4. මේවාට ගැළපෙන පාලි වචන ලියන්න.

1. බුදුරජ විසින් - බුද්‍ධෙන
2. බුදුවරුන් කරණකොට - බුද්‍ධෙභි
3. බුදුරජ කෙරෙහි - බුද්‍ධෙ
4. කුරුළු වැද්දාට - වට්ටකලුද්දකස්ස
5. වටු කුරුල්ලෝ - වට්ටකා

WWW.PIRIVENA.lk

05. 1

1. මහාමඞගල සූත්‍රය දේශනා කළේ කාහට ද? එක්තරා දෙවියෙකුට

2. පාඩමේ එන ගාථාවල දැක්වෙන මංගල කරුණු සොයා ලියන්න.

අසෙවනා ච බාලානං - අනුවණයන් ඇසුරු නොකිරීම

පණ්ඩිතානං ච සෙවනා - පණ්ඩිතයන් ඇසුරු කිරීම

පූජා ච පූජනීයානං - පිදිය යුත්තන් පිදීම

පතිරූපදෙසවාසො ච - සුදුසු පෙදෙසක වාසය කිරීම

පුබ්බෙ ච කතපුඤ්ඤතා - පෙර කළ පින් ඇති බව

අත්තසම්මාපණිධි ච - මෙලොව මනා දහමේ යෙදීම

බාහුසච්චඤ්ච සිප්පඤ්ච - බහුශ්‍රැත බව, ශිල්පයෙහි නිපුණබව

විනයො ච සුසික්ඛිතො - මනාව හික්මුණු බව

සුභාසිතා ච යා වාචා - වචනයේ සංවර බව

මාතුපිතු උපට්ඨානං - මාපිය උපස්ථානය

පුත්තදාරස්ස සඞ්ගහො - අඹුදරුවන් පෝෂණය කිරීම

අනාකුලා ච කම්මන්තා - නිවැරදි කර්මාන්තයන්හි යෙදීම

3. එහි දැක්වෙන නාම පද පහක් තෝරා ලියන්න.

දෙවා, මනුස්සා, බාලා, පණ්ඩිතා, දෙස, සිප්ප, විනය, වාචා, මාතා, පිතු, පුත්ත

WWW.PIRIVENA.lk

4. එහි තිබෙන ක්‍රියා පද දෙකක් තෝරා ලියන්න.

අචින්තයුං, බ්‍රෑහි

5. එම ගාථා පන්තිය පාලි රීතිය නොබිඳ තාලයට සජ්ඣායනා කරන්න.

WWW.PIRIVENA.lk

06. 1

1. පහත සඳහන් වගන්ති සිංහලට නගන්න.

    1. බුද්ධා දෙසෙති - බුදුරජ දේශනා කරයි
    2. දෙවා භාසන්ති - දෙවිවරු කියති
    3. මනුස්සා කරොන්ති - මිනිස්සු කරති
    4. සො කරොති - ඔහු කරයි
    5. ත්වං කරොසි - නුඹ කරහි

2. පහත සඳහන් වගන්ති පාලියට නගන්න.

    1. මව සෝදයි - මාතා ධොවති
    2. මම දුවයි - අහං ධාවාමි
    3. නුඹලා බලහු - තුම්හෙ පස්සථ
    4. භික්ෂුව සක්මන් කරයි - භික්ඛු චඞ්කමති
    5. බුදුවරු දේශනා කරති - බුද්ධා දෙසෙන්ති

3. නාම පද හා ක්‍රියා පද නිවැරදිව ගළපා පාලි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

අහං රක්ඛාමි - මම රකිමි

ත්වං පඨසි - නුඹ පාඩම් කරහි

මයං සයාම - අපි නිදමු

බාලකො ගච්ඡති - ළමයා යයි

පිතා ඛාදති - පියා කයි

WWW.PIRIVENA.lk

4. සර්ව නාම හා නාම පද ගළපා වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

අහං සිස්සො භවාමි - මම ශිෂ්‍යයෙක් වෙමි.

ත්වං භික්ඛු භවසි - නුඹ භික්ෂුවක් වෙහි.

තෙ බාලකා හොන්ති - ඔවුහු ළමයි වෙති.

අයං පදීපං හොති - මෙය පහනක් වෙයි.

කො අයං - මේ කවුද?

5. ඔබ කැමති ක්‍රියා පද දෙකක් වර්තමාන කාලයේ පුරුෂ තුනෙහි වරනගා අර්ථය ලියන්න.

පුරිස	එක වචන	බහු වචන
පඨම පුරිස	වදති (කියයි)	වදන්ති (කියති)
මජ්ඣිම පුරිස	වදසි (කියහි)	වදථ (කියහු)
උත්තම පුරිස	වදාමි (කියමි)	වදාම (කියමු)

පුරිස	**එක වචන**	**බහු වචන**
පඨම පුරිස	ඛාදති (කයි)	ඛාදන්ති (කති)
මජ්ඣිම පුරිස	ඛාදසි (කහි)	ඛාදථ (කහු)
උත්තම පුරිස	ඛාදාමි (කමි)	ඛාදාම (කමු)

WWW.PIRIVENA.lk

07. 1

1. සිංහලට නගන්න.

1. හෙ කුමාර, ඉධ තිට්ඨසි - පින්වත් කුමාරය, මෙහි සිටිහි.

2. හෙ භූපාල, ත්‍වං ඉතො නික්ඛම - පින්වත් රජ, නුඹ මෙතැනින් නික්මෙන්න

3. හෙ ආනන්‍ද, කො අයං? - පින්වත් ආනන්ද, මේ කුමක් ද?

4. හෙ ආචරිය, අයං පදීපො - පින්වත් ගුරුතුමනි, මේ පහනකි.

5. භවන්‍තො කුමාරා, තුම්හෙ ධාවථ - පින්වත් කුමාරවරුනි, නුඹලා දුවහු

2. පාලියට නගන්න.

1. පින්වත් කුමාරය, ඔබ කවරෙක් ද?
හෙ කුමාර, කො ත්‍වං?

2. පින්වත් යහළුව, මම සෝරත
හෙ මිත්‍ත, අහං සොරත

3. එම්බා අශ්වයිනි, තොපි දුවවු.
භවන්‍තො අස්සා, තුම්හෙ ධාවථ

4. පින්වත් මහ ඇමතිතුමනි, හිඳගන්න.
හෙ මහාමච්ච, නිසීදසි

5. එම්බා සේවකය, මෙතැනින් යන්න.
හෙ සෙවක, ඉතො නික්ඛම

WWW.PIRIVENA.lk

3. ආලපන විභක්ති පද යොදා ඔබ කැමති වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

හෙ ආචරිය, ඉධ තිට්ඨසි - පින්වත් ගුරුතුමනි, මෙහි සිටින්න

හෙ මිත්ත, ඉතො නික්ඛම - පින්වත් මිතුර, මෙතැනින් නික්මෙන්න.

භවන්තො සකුණා, තුම්හෙ ඛාදථ - එම්බා කුරුල්ලනි, නුඹලා කනු

හෙ නර, ත්වං ගච්ඡසි - පින්වත් මිනිස, නුඹ යන්න

හෙ චොර, ත්වං ධාවසි - එම්බල සොර, නුඹ දුවහි

4. ඔබ කැමති නාම දහයක් ආලපන විභක්ති රූපයෙන් ලියන්න.

නර - හෙ නර, භවන්තො නරා

බුද්ධ - හෙ බුද්ධ, භවන්තො බුද්ධා

සකුණ - හෙ සකුණ, භවන්තො සකුණා

මිත්ත - හෙ මිත්ත, භවන්තො මිත්තා

යොධ - හෙ යොධ, භවන්තො යොධා

යක්ඛ - හෙ යක්ඛ, භවන්තො යක්ඛා

මුනි - හෙ මුනි, භවන්තො මුනයො

අස්ස - හෙ අස්ස, භවන්තො අස්සා

චන්ද - හෙ චන්ද, භවන්තො චන්දා

අමච්ච - හෙ අමච්ච, භවන්තො අමච්චා

WWW.PIRIVENA.lk

08. 1

1. සිංහලට නගන්න

    1. ධනපාලො ගෙහං ගච්ඡති - ධනපාල ගෙදරට යයි

    2. දාසො රුක්ඛං ඡින්දති - දාසයා ගස කපයි

    3. සූදො භත්තං පචති - උයන්නා / අරක්කැමියා බත් උයයි

    4. යාචකො ඔදනං යාචති - යාචකයා ආහාර ඉල්ලයි

    5. මනුස්සා කම්මානි කරොන්ති - මිනිස්සු වැඩ කරති

2. පාලියට නගන්න.

    1. ගොවියා කුඹුරට යයි - කස්සකො ඛෙත්තං ගච්ඡති.

    2. කම්කරුවා වැඩ කරයි - කම්මකාරො වඩ්ඪිං කරොති.

    3. ගොපල්ලා එළුවෙකු ගෙන යයි - ගොපාලො අජං හරති.

    4. දරුවා මලක් කඩයි - දාරකො පුප්ඵං ඔචිනාති.

    5. භික්ෂුව පන්සලට වඩියි - භික්ඛු පණ්ණසාලං ගච්ඡති.

3. ඔබ කැමති දුතියා විභක්ත්‍යන්ත පද යොදා ගෙන වගන්ති 5ක් නිර්මාණය කරන්න.

    මාතා ඔදනං පචති - අම්මා බත් උයයි.

    වාණිජො නගරං ගච්ඡති - වෙළෙන්දා නගරයට යයි.

    භික්ඛු ආරාමං පවිසති - භික්ෂුව ආරාමයට පිවිසෙයි.

    දාරිකා පුප්ඵානි ඔචිනාති - දැරිය මල් නෙළයි.

WWW.PIRIVENA.lk

අහං පොත්ථකං පඨාමි - මම පොත පාඩම් කරමි.

4. මේ පදවල දුතියා විභක්ත්‍යන්ත රූප ලියන්න.

    1. නර (මිනිසා) - නරං, නරෙ

    2. කපි (වඳුරා) - කපිං, කපයො

    3. ආචරිය (ගුරුවරයා) - ආචරියං, ආචරියෙ

    4. පඤ්ඤා (ප්‍රඥාව) - පඤ්ඤං, පඤ්ඤායො

    5. ඵලං (ගෙඩිය) - ඵලං, ඵලෙ

5. දුතියා විභක්ති නාමපද වගුව ශබ්ද නගා කියවන්න.

WWW.PIRIVENA.lk

09. 1

1. සිංහලට නගන්න.

1. අහං සිසෙසන සද්ධිං වන්දාමි - මම ශිෂ්‍යයා සමග වඳිමි.

2. මිත්තො ආනන්දෙන සහ ගච්ඡති - මිතුරා ආනන්ද සමග යයි.

3. ත්වං දාසෙන සහ ගච්ඡසි - නුඹ දාසයා සමග යහි

4. දහරො මාතුයා සද්ධිං සයති - ළදරුවා මව සමග නිදයි.

5. තෙ කස්සකෙන සද්ධිං ඛෙත්තං ගච්ඡන්ති - ඔවුහු ගොවියන් සමග කුඹුරට යති.

2. පාලියට නගන්න.

1. නුඹ සිරිදාස සමග යහි - ත්වං සිරිදාසෙන සද්ධිං ගච්ඡසි.

2. මම සෝරත සමග ගෙදර යමි -අහං සොරතෙන සද්ධිං ගෙහං ගච්ඡාමි.

3. ගොවියා මිතුරන් සමග කුඹුරට යයි - කස්සකො මිත්තෙහි සද්ධිං ඛෙත්තං ගච්ඡති.

4. කවරෙක් ශිෂ්‍යයා සමග ලියයි ද? කො සිසෙසන සද්ධිං ලිඛති ?

5. ඇමතිවරු රජු සමග කතා කරති - අමච්චා භූපාලෙන සහ සල්ලපන්ති.

WWW.PIRIVENA.lk

3. සහ, සද්ධිං යන පද දෙක තතියා විභක්ති පද සමග යොදා වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

- ❖ ත්වං මිත්තෙන සහ ගාමං ගච්ඡසි -නුඹ මිතුරා සමග ගමට යහි.
- ❖ අහං දාරකෙන සහ පාඨාලයං ගච්ඡාමි - මම දරුවා සමග පාසලට යමි.
- ❖ කස්සකො පුත්තෙන සද්ධිං වනං පවිසති - ගොවියා පුතා සමග වනයට පිවිසෙයි.
- ❖ ආචරියො ආචරියෙහි සහ පණ්ණසාලං ගච්ඡති - ගුරුවරයා ගුරුවරයන් සමග පන්සලට යයි.
- ❖ අමච්චා භූපාලෙන සද්ධිං පාසාදං ගච්ඡන්ති - ඇමතිවරු රජතුමා සමග ප්‍රාසාදයට යති.

4. පාඩමේ එන කතාව සිංහලට නගන්න.

- ❖ එකස්මිං ගාමෙ එකො කස්සකො වසති.

  එක් ගමක එක් ගොවියෙක් වාසය කරයි.
- ❖ සො සිරිදාසො නාම.

  ඔහු සිරිදාස නම් වේ.
- ❖ තස්ස එකො පුත්තො භවති.

  ඔහුට එක පුතෙක් වෙයි.
- ❖ සො සුනන්දො නාම.

  ඔහු සුනන්ද නම් ය.

WWW.PIRIVENA.lk

- ❖ එකදා සිරිදාසො පුත්තෙන සද්ධිං තස්ස ඛෙත්තං ගච්ඡති.

  එක දවසක් සිරිදාස පුතා සමග ඔහුගේ කුඹුරට යයි.

- ❖ ඛෙත්තෙ කම්මං කත්වා සො පච්ඡා ගෙහං ආගච්ඡති.

  කුඹුරෙහි කටයුතු කොට ඔහු පසුව ගෙදරට එයි.

- ❖ අථ ඛො සුනන්දො නාම පුත්තො තස්ස මාතුයා සහ ආපණං ගච්ඡති.

  ඉක්බිති සුනන්ද නම් පුතා වනාහි ඔහුගේ මව සමග කඩයට යයි.

- ❖ තදා තස්ස මිත්තා මග්ගෙ කීළන්ති.

  ඒ වෙලාවේ ඔහුගේ මිතුරෝ පාරෙහි සෙල්ලම් කරති.

- ❖ සිරිදාසස්ස පුත්තස්ස ච එතදහොසි.

  සිරිදාසගේ පුතාට ද මෙසේ සිත් විය.

- ❖ අහං ච මම මිත්තෙන සද්ධිං කීළිතුං ගච්ඡාමීති

  මම ද මගේ මිතුරා සමග ක්‍රීඩා කිරීමට යමී'යි

- ❖ අථ මාතරං වන්දිත්වා සො මිත්තෙහි සහ කීළිතුං ගච්ඡති

  ඉක්බිති මවට වැඳ ඔහු මිතුරන් සමග ක්‍රීඩා කිරීමට යයි.

5. පිරිත් පොත බලා 'සහ' සහ 'සද්ධිං' යන නිපාත පද යෙදුණු පාලි වගන්ති සොයා ලියන්න.

මම සද්ධිං සමෙමොදිංසු සමෙමොදනීයං කථං....

WWW.PIRIVENA.lk

භගවතා සද්ධිං සම්මොදිංසු..

සද්ධිං හොන්තු සුඛී සබ්බෙ....

සහ සබ්බෙහි ඤාතිහී...

WWW.PIRIVENA.lk

10. 1

1. සිංහලයට නගන්න.

1. ආනන්දො හත්ථෙන සකුණං ආහරති - ආනන්ද අතින් කුරුල්ලා ගෙනෙයි.

2. එසො රථෙන ගාමං ගච්ඡති - ඔහු රථයෙන් ගමට යයි.

3. ත්වං පාදෙන මා පහරි - නුඹ පයෙන් පහර දෙන්න එපා.

4. තුම්හෙ කෙන ආගච්ඡථ - නුඹලා කුමකින් ආවෙහු ද?

5. අහං ඉමිනා පුඤ්ඤකම්මෙන මොක්ඛං ලභාමි - මම මේ පිනින් මෝක්ෂය ලබමි.

2. පාලියට නගන්න.

1. ඇතා පාවලින් දුවයි - ගජො පාදෙහි ධාවති.

2. ළමයා දණ්ඩෙන් ගසයි - බාලකො දණ්ඩෙන පහරති.

3. හෙතෙම කුමකින් ගසයි ද? සො කෙන පහරති ?

4. ගුරුතුමා අතින් ගනියි - ආචරියො හත්ථෙන ගණ්හාති.

5. වඳුරා අත්වලින් ද පාවලින් ද පනියි - වානරො හත්ථෙහි ච පාදෙහි ච පක්ඛන්දති.

3. කරණ විභක්ත්‍යන්ත පද යොදා වාක්‍ය පහක් සාදන්න.

- සො සොතෙන සුණාති - ඔහු කනෙන් අසයි.
- කස්සකො සකටෙන ඛෙත්තං ගච්ඡති - ගොවියා කරත්තයෙන් කුඹුරට යයි.

WWW.PIRIVENA.lk

- ❖ මාතා හත්ථෙන පදීපං ජාලෙති - අම්මා අතින් පහන දල්වයි.
- ❖ භික්ඛු නෙත්තෙහි රූපානි පස්සති - භික්ෂුව ඇස්වලින් රූප බලයි.
- ❖ උපාසකො ධූමරථෙන පණ්ණසාලං ගච්ඡති - උපාසකයා දුම්රියෙන් පන්සලට යයි.

4. පාඩම් එන ගාථා සිංහලට නගන්න.

න හි වෙරෙන වෙරානි - සම්මන්තී'ධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති - එසධම්මො සනන්තනො

මේ ලෝකයෙහි වෛරයෙන් වෛරයෝ කිසිකලෙක්හිදු නො සන්සිඳෙන්නා හ. අවෛරයෙන් ම වෛරය සන්සිඳෙන්නා හ. මේ (අවෛරයෙන් වෛරය සන්සිඳවීම) පුරාතන වූ ගුණ ධර්මයකි.

පරෙ ච න විජානන්ති - මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති - තතො සම්මන්ති මෙධගා

මේ (සඟ) මැද (පණ්ඩිත ජනයා කෙරෙන් අන්‍ය වූ කළහකාර) යමෙක් අපි නසුම්හයි නොදතිත් ද, ඒ කළහකරුවන් අතුරෙහි යම් (පණ්ඩිත ජන) කෙනෙක් වනාහි (අපි නසම්හයි) දනිද්ද ඒ හේතුවෙන් කළහයෝ සන්සිඳෙන්නා හ.

සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි අමත්තඤ්ඤුං - කුසීතං හීනවීරියං
තං වෙ පසහති මාරො - වාතො රුක්ඛං'ව දුබ්බලං

(විසභාග අරමුණු) ශුභ වශයෙන් අනුව බලමින් වාසය කරන්නා වූ, (එහෙයින් ම චක්ෂුරාදී) ෂඩින්ද්‍රියයන් කෙරෙහි සංවරයක් නැත්තා වූ ආහාරයෙහි ද පමණ නොදන්නා වූ,

WWW.PIRIVENA.lk

කුසීත වූ (හෙවත් ග්‍රන්ථධුර විදර්ශනා ධුරයන්හි ද වත් පිළිවෙත් පිරීමෙහි ද මැළි වූ) වීර්යය රහිත වූ ඒ (මෙබඳු) පුද්ගලයා (ක්ලේශ) මාරතෙම ඒකාන්තයෙන් මැඩපවත්නේයි. කුමක් මෙන් ද යත් (ප්‍රචණ්ඩ) වාතය තෙම දුර්වල වෘක්ෂයක් (උපුටා හෙලන්නාක්) මෙනි.

අසුභානුපසසිං විහරන්තං - ඉන්‍ද්‍රියෙසු සුසංවුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං - සද්ධං ආරද්ධවීරියං
තං වෙ නප්පසහති මාරො - වාතො සෙලං'ව පබ්බතං

(උද්ධුමාතකාදි) අශුභයක් අනුව බලමින් වසන්නා වූ (චක්ෂුරාදි) ෂඩින්ද්‍රියයන් කෙරෙහි මනා සංවරයෙන් යුක්ත වූ ආහාරයෙහි ද පමණ දන්නා වූ, ශ්‍රද්ධාවෙන් යුක්ත වූ (සතර ඉරියව්වෙහි) වඩන ලද වීර්යය ඇති ඒ (මෙබඳු) පුද්ගලයෝ (ක්ලේශ) මාරතෙම ඒ කාන්තයෙන් මැඩ නොපවත්නේ ය. කුමක් මෙන් ද යත් (දුර්වල) වාතය තෙම (ඝන) ශෛල පර්වතයක් (නොසෙල්වෙන) මෙනි.

WWW.PIRIVENA.lk

11. 1

1. සිංහලට නගන්න.

1. ත්වං ඉදානි තස්ස පත්තං දෙහි - නුඹ දැන් ඔහුට පාත්‍රය දෙන්න.

2. චොරො වාණිජාය අස්සං දෙති - සොරා වෙළෙන්දාට අශ්වයා දෙයි.

3. තුමෙහ කස්සකානං ගොණෙ දදථ - නුඹලා ගොවියන්ට ගොනුන් දෙහු.

4. භූපාලො ගජස්ස ආහාරං දෙති - රජතුමා ඇතාට ආහාර දෙයි.

5. මයං සාමණෙරස්ස දානං දෙම - අපි සාමණෙරයන් වහන්සේට දානය දෙමු

2. පාලියට නගන්න.

1. මම බුදුන්ට පහන් පුදමි - අහං බුද්ධාය පදීපං පූජෙමි.

2. හෙතෙම කුරුල්ලන්ට කෑම දෙයි - සො සකුණානං ආහාරං දෙති.

3. සේවකයා ස්වාමියාට මොණරෙකු දෙයි - සෙවකො සාමිනා මයූරං දෙති.

4. දායකයෝ භික්ෂූන්ට දානය දෙති - දායකා භික්ඛූනං දානං දෙන්ති.

5. මිනිස්සු සතුන්ට හිංසා නො කරති - මනුස්සා සත්තානං න හිංසන්ති.

WWW.PIRIVENA.lk

3. චතුත්ථී විභක්ත්‍යන්ත පද යොදා වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

- ❖ අහං මිත්තස්ස පොත්ථකං දදාමි - මම මිතුරාට පොතක් දෙමි.
- ❖ මාතා දාරිකාය ඛීරං දදාති -මව දැරියට කිරි දෙයි.
- ❖ පිතා පුත්තස්ස පදීපං දෙති - පියා පුතාට පහනක් දෙයි.
- ❖ ආචරියො සිස්සානං ඔවාදං දෙති - ගුරුවරයා සිසුන්ට අවවාද දෙයි.
- ❖ තුම්හෙ තෙසානං වත්ථානි දදථ - නුඹලා ඔවුන්ට වස්ත්‍ර දෙහු.

4. චතුත්ථී විභක්ත්‍යන්ත පද යොදා මේ වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. සො <u>මිත්තස්ස</u> පොත්ථකං දෙති - ඔහු මිතුරාට පොතක් දෙයි.
2. කුමාරො <u>යාචකානං</u> ආහාරං දෙති - කුමාරයා යාචකයන්ට ආහාර දෙයි.
3. සිස්සා <u>ගුරූනං</u> උපහාරං දෙන්ති - සිසුහු ගුරුවරුන්ට උපහාර දෙති.
4. සුනඛී <u>පොතකස්ස</u> ඛීරං දෙති - බැල්ලී පැටියාට කිරි දෙයි.
5. ත්වං <u>ඤාතීනං</u> උපකාරං කරොහි - නුඹ ඤාතීන්ට උපකාර කරහි.

WWW.PIRIVENA.lk

12. 1

1. පහත සඳහන් වගන්ති සිංහලට නගන්න.

1. බුද්ධා ධම්මං දෙසෙස්සති - බුදුරජ ධර්මය දේශනා කරන්නේ ය.

2. දෙවා සාධුකං භාසිස්සන්ති - දෙවිවරු මනාකොට කියන්නෝ ය

3. මනුස්සා කම්මං කරිස්සන්ති - මිනිස්සු වැඩ කරන්නෝ ය

4. සො තං පස්සිස්සති - ඔහු එය බලන්නේ ය.

5. ත්වං කිං පචිස්සසි? නුඹ කුමක් උයන්නෙහි ද?

2. පහත සඳහන් අනාගත කාලික වගන්ති පාලියට නගන්න.

1. මව දරුවාට කිරි දෙන්නී ය - මාතා පුත්තාය ඛීරං දදිස්සති.

2. මම පාඩම් කරන්නෙමි - අහං පාඨං පඨිස්සාමි.

3. නුඹලා කුමක් කියන්නෙහු ද? - තුම්හෙ කිං වදිස්සථ?

4. භික්ෂුව ධර්මය දේශනා කරන්නේ ය - භික්ඛු ධම්මං දෙසෙස්සති.

5. බුදුවරු මතු උපදින්නා හ - බුද්ධා මත්ථකෙ උප්පජ්ජිස්සන්ති.

WWW.PIRIVENA.lk

3. නාම පදයක් කර්ම පදයක් හා ක්‍රියාපදයක් නිවැරදිව ගළපා අනාගත කාලයෙහි පාලි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

- ❖ පිතා ඛෙත්තං ගච්ඡිස්සති - පියා කුඹුරට යන්නේ ය.
- ❖ මාතා ඛීරං දදිස්සති - මව කිරි දෙන්නී ය.
- ❖ ආචරියො පාඨං උග්ගණ්හිස්සති - ගුරුවරයා පාඩම උගන්වන්නේ ය.
- ❖ මයං බුද්ධං වන්දිස්සාම -අපි බුදුන් වඳින්නෙමු.
- ❖ උපාසකො ධම්මං සුණිස්සති - උපාසකයා ධර්මය අසන්නේ ය.

4. ඔබ කැමති ක්‍රියා පද දෙකක් අනාගත කාලයේ පුරුෂ තුනෙහි වරනගා අර්ථය ලියන්න.

පුරිස	එක වචන	බහු වචන
පඨම පුරිස	වදිස්සති (කියන්නේ ය)	වදිස්සන්ති (කියන්නෝ ය)
මජ්ඣිම පුරිස	වදිස්සසි (කියන්නෙහි)	වදිස්සථ (කියන්නෙහු)
උත්තම පුරිස	වදිස්සාමි (කියන්නෙමි)	වදිස්සාම (කියන්නෙමු)

WWW.PIRIVENA.lk

පුරිස	එක වචන	බහු වචන
පඨම පුරිස	බාදිස්සති (කන්නේ ය)	බාදිස්සන්ති (කන්නෝ ය)
මජ්ඣිම පුරිස	බාදිස්සසි (කන්නෙහි)	බාදිස්සථ (කන්නෙහු)
උත්තම පුරිස	බාදිස්සාමි (කන්නෙමි)	බාදිස්සාම (කන්නෙමු)

5. පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව සිංහලට නගන්න.

පටිසංඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි. නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය. යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉතිපුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි. නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසු විහාරොචා'ති

සිංහල අර්ථය -

මා මේ ආහාරය වළඳන්නේ විනෝදය පිණිස නො වේ. පුරුෂමදාදිය වඩනු පිණිස ද නො වේ. ඇඟ තර කර ගැනීම පිණිස ද නො වේ. ඇඟ පැහැපත් කර ගැනීම පිණිස ද නො වේ. මා මේ ආහාරය වළඳන්නේ ශරීරයත් ජීවිතයත් පවත්වා ගනු පිණිස ය. සාගිනි වේදනාව දුරු කර ගනු පිණිස ය. බුදුසස්නෙහි පිළිවෙත් පිරිය හැකි වනු සඳහා ය. ජීවිතය චිරකාලයක් පවත්වා ගනු සඳහා ය. මෙසේ ආහාර වැළඳීමෙන් මාගේ සාගිනි වේදනාව දුරු වන්නේ ය. පමණ ඉක්මවා ආහාර වැළඳීමෙන් වන වේදනා ද නො වන්නේය. ජීවිතය චිරකාලයක් පැවැත්විය හැකි ද වන්නේ ය. මෙසේ ආහාර වැළඳීම අයුතු ලෙස ආහාර

WWW.PIRIVENA.lk

සපයා වැළඳීමක් නොවන හෙයින් නිවැරදි ආහාර වැළඳීමක් ද වන්නේ ය. මෙසේ පමණට ආහාර වැළඳීමෙන් සුවසේ විසිය හැකි ද වන්නේ ය.

WWW.PIRIVENA.lk

13. 1

1. සිංහලයට නගන්න.

1. මූසිකො බිළාලම්හා භායති - මීයා බළලාගෙන් බිය වෙයි.

2. මනුස්සො රුක්ඛම්හා පතති - මිනිසා පර්වතයෙන් වැටෙයි.

3.ත්වං කම්හා භායසි - නුඹ කවරෙක්ගෙන් භය වෙහි ද?

4. සකුණා පබ්බතම්හා උඩ්ඩෙන්ති - කුරුල්ලෝ පර්වතයෙන් පියාඹති.

5. අහං ආරාමම්හා පරිවෙණං ගමිස්සාමි - මම ආරාමයෙන් පිරිවෙණට යන්නෙමි.

2. පාලියට නගන්න.

1. මම අලියාගෙන් භය වෙමි - අහං ගජම්හා භායාමි.

2. තවුසා උපාසකයාගෙන් පාත්‍රය ගනියි - තාපසො උපාසකම්හා පත්තං ගණ්හාති.

3. චන්ද්‍රයා කුමකින් පායයි ද? - චන්දො කම්හා උදෙති?

4. කුමාරයෝ ප්‍රාසාදයෙන් නික්මෙති - කුමාරා පාසාදම්හා නික්ඛමන්ති.

5. තෙරුන් වහන්සේ හෙට පන්සලට වඩින සේක - ථෙරො සුවෙ පණ්ණසාලං ගච්ඡිස්සති.

WWW.PIRIVENA.lk

3. ඔබ දන්නා පඤ්චමී විභක්ත්‍යන්ත පද යොදා වගන්ති පහක් නිර්මාණය කරන්න.

- ❖ මනුසසා ව්‍යාධමහා භායනති -මිනිස්සු වැද්දාගෙන් බියවෙති.
- ❖ කුමාරො ආචරියමහා පොත්ථකං ගණහාති - කුමාරයා ගුරුවරයාගෙන් පොත ගනියි.
- ❖ උපාසකො බුදධමහා ධමමං සුණාති - උපාසකයා බුදුන්ගෙන් බණ අසයි.
- ❖ මිගො සීහමහා භායති - මුවා සිංහයාගෙන් බිය වෙයි.
- ❖ ඵලානි රුකඛමහා පතනති - ගෙඩි ගසින් වැටෙයි.

4. පාඩමේ එන ඡේදය සිංහලට නගන්න.

මිග ලුදදකො - මුව වැද්දා

❖ අමහාකං කිර භගවතො පුබබෙ ලොකපජ්ජොතො ලොකනයනො ලොකතාණො කසසපො නාම භගවා ලොකෙ උදපාදි, සදෙවකං ලොකං නිබබාණපුරං පාපෙනෙතා.

අපගේ භාග්‍යවතුන් වහන්සේ වනාහි පෙර ලොවට පහනක් බඳු වූ ලොවට ඇසක් වූ ලොව රක්නා කස්සප නම් බුදුරජාණන් වහන්සේ සදේවක ලෝකයා නිර්වාණපුරයට යොමු කරන්නේ (එකල) ඉපදුණේ ය.

❖ තසමිං සමයෙ පචචනතගාමවාසිකො එකො මනුසෙසා වනෙ මිගසූකරාදයො බනධිත්වා වජෙ කත්වා තෙ පොසෙනෙතා, නිචචං පාණාතිපාතං කත්වා ජීවති.

WWW.PIRIVENA.lk

එම සමයේ පසල් ගම්වැසි එක් මනුෂ්‍යයෙක් වනයෙහි මුවන් ඌරන් ආදිය බැඳ ගාල්කොට උන් පෝෂණය කරමින්, නිතර ප්‍රාණඝාතය කොට ජීවත් වෙයි.

❖ අපරභාගෙ සො පිණ්ඩාය චරමානං එකං භික්ඛුං දිස්වා ගන්ත්වා තස්ස පත්තං ගහෙත්වා තං අත්තනො ගෙහං නෙත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදාපෙත්වා, මිගසූකරමද්දවං උපනෙත්වා, භොජෙත්වා, දිවා මංසරසපිණ්ඩපාතං දත්වා, භුත්තාවසානෙ එකමන්තං නිසීදි.

පසු කාලයෙහි ඔහු පිඬු පිණිස හැසිරෙන එක් භික්ෂුවක දැක ගොස් උන්වහන්සේගේ (ඔහුගේ) පාත්‍රය ගෙන උන්වහන්සේ (ඔහු) තමාගේ නිවසට පමුණුවා පැනවූ ආසනයක හිඳුවා මුව හා ඌරු මස් සහිත (ආහාර) ගෙනැවිත් අනුභව කරවා දහවල් මස් රසැති පිණ්ඩපාතය දී අනුභවය අවසාන වේලෙහි එකත්පසෙක හුන්නේ ය.

WWW.PIRIVENA.lk

14. 1

1. සිංහලට නගන්න.

1. ත්වං කස්ස පුත්තො භවසි ?

නුඹ කාගේ පුතා වෙහි ද?

2. දුට්ඨගාමිණීකුමාරො කාකවණ්ණතිස්සස්ස පුත්තො භවති.

දුටුගැමුණු කුමාරයා කාවන්තිස්ස රජතුමාගේ පුතා වෙයි.

3. අහං තව පොත්ථකං ගණ්හාමි

මම නුඹගේ පොත ගනිමි.

4. භික්ඛු උපාසකස්ස ගෙහං ගච්ඡති.

භික්ෂුව උපාසකයාගේ නිවසට යයි.

5. පුත්තා මිත්තානං සකුණෙ කිණන්ති.

පුත්තු මිතුරන්ගේ කුරුල්ලන් මිළ දී ගනිති.

2. පාලියට නගන්න.

1. අපි ගොවියන්ගේ ගොනුන් ගෙන යමු.

මයං කස්සකානං ගොණෙ හරාම.

2. උපාසකයා තවුසාගේ චීවරය සෝදයි.

උපාසකො තාපසස්ස චීවරං ධොවති.

3. සොරු එළුවන්ගේ පාද සිඳිති.

චොරා අජානං පාදෙ ඡින්දන්ති.

WWW.PIRIVENA.lk

4. මොණරු සූර්යයාගේ ආලෝකයෙන් නටති.

මයූරා සුරියස්ස ආලොකෙන නච්චන්ති.

5. වෙළෙන්දා මිනිසාගේ ගොනා විකුණයි.

වාණිජො නරස්ස ගොණං වික්කිණාති.

3. ඔබ දන්නා නාම පහක් යොදාගෙන ෂට්ඨී විභක්ත්‍යන්ත වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

❖ භූපාලස්ස වත්ථං යාචකස්ස දදාති.

රජතුමාගේ වස්ත්‍රය යාචකයාට දෙයි.

❖ මම පොත්ථකං මිත්තස්ස දදාමි.

මගේ පොත මිතුරාට දෙමි.

❖ කුමාරො මිත්තස්ස හත්ථං චුම්බති.

කුමාරයා මිතුරාගේ අත සිඹියි.

❖ අජො ලුද්දකස්ස හත්ථං ගණ්හාති.

එළුවා වැද්දාගේ අත ගනියි.

❖ මාතා පුත්තස්ස ගෙහං ගච්ඡති.

අම්මා පුතාගේ නිවසට යයි.

WWW.PIRIVENA.lk

4. ඔබ කැමති නාම දහයක ඡට්ඨී විභක්ත්‍යන්ත ඒකවචන රූප ලියන්න.

1. බුද්ධ - බුද්ධාය, බුද්ධස්ස
2. නර - නරාය, නරස්ස
3. සිස්ස -සිස්සාය, සිස්සස්ස
4. භික්ඛු - භික්ඛුනො, භික්ඛුස්ස
5. කඤ්ඤා - කඤ්ඤාය
6. වනිතා - වනිතාය
7. චිත්ත - චිත්තස්ස
8. සබ්බ - සබ්බස්ස
9. ඉම - අස්ස, ඉමස්ස
10. නදී - නදියා, නජ්ජා

5. පාඩමේ ඇති ඡේදය සිංහලට නගන්න.

❖ එවං මෙ සුතං.

මා විසින් මෙසේ අසන ලදි.

❖ එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැතෙහි අනේපිඬු සිටුවරයාගේ දෙව්රමෙහි වාසය කරති.

❖ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.

එකල්හි වනාහි භාග්‍යවත්හු භික්ෂූන් ඇමතූහ මහණෙනි කියා වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

❖ භගවා එතදවොච.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

WWW.PIRIVENA.lk

❖ මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානිකථාය වත්ථු කථාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකඞ්ඛා. කතමෙ එකාදස?

මහණෙනි, අදරින් සෙවුනා ලද, වඩනා ලද, බහුල වශයෙන් (නැවත නැවත) කරන ලද යානාවක් බඳු කරන ලද, ප්‍රතිෂ්ඨානාර්ථයෙන් වස්තුවක් මෙන් කරන ලද, එළඹ සිටි පුරුදු කරන ලද, මොනොවට පටන් ගන්නා ලද මෛත්‍රීචිත්තවිමුක්තියෙහි අට අනුසස් කෙනෙක් කැමති විය යුත්තාහ. කවර අට දෙනෙක යත්:

❖ සුඛං සුපති.

සුවසේ නිදයි.

❖ සුඛං පටිබුජ්ඣති.

සුවසේ පිබිදෙයි.

❖ න පාපකං සුපිනං පස්සති.

නපුරු සිහින නො දකියි.

❖ මනුස්සානං පියො හොති.

මිනිස්නට ප්‍රිය වෙයි,

❖ අමනුස්සානං පියො හොති.

අමනුෂ්‍යයනට ප්‍රිය වෙයි

❖ දෙවතා රක්ඛන්ති.

දෙවියෝ රක්නාහ

❖ නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති.

ඕහට ගිනි වේවයි, විෂ ගිනි වේවයි, අවි වේවයි නො වදනේ ය

WWW.PIRIVENA.lk

❖ තුවටං චිත්තං සමාධියති.

වහා සිත සමාධි ගත වේ.

❖ මුඛ වණ්ණො විප්පසීදති.

මුහුණ පැහැපත් වේ.

❖ අසම්මූළ්හො කාලං කරොති.

නොමුළාව කළුරිය කරයි.

❖ උත්තරිං අප්පටිවිජ්ජන්තො බ්‍රහ්මලොකූපගො හොති.

මෛත්‍රී සමවතින් (මතු රහත් වන්නට නොහැකි වී නම්) මරණින් මතු බඹලොව උපදියි.

WWW.PIRIVENA.lk

15. 1

1. පහත සඳහන් වගන්ති සිංහලයට නගන්න.

1. සිගාලො වනං ගච්ඡි - නරියා වනයට ගියේ ය.

2. සාරථී රථං ආනෙසි - රියදුරා රථය ගෙනාවේ ය.

3. මුනි ධම්මං අභාසි - මුනිවරයා ධර්මය කීවේ ය.

4. දණ්ඩී යට්ඨිනා භොගිං පහරි - දඬුගත් තැනැත්තා යෂ්ටියෙන් හොඬවැලට පහර දුන්නේ ය.

5. කපයො අහිනො සීසං පහරිංසු - වඳුරෝ සර්පයාගේ හිසට පහර දුන්නේ ය.

2. පහත සඳහන් වගන්ති පාලියට නගන්න.

1. පව්කාරයා බල්ලාට ගැසුවේ ය.

පාපකාරී සුනඛස්ස පහරි.

2. ඉසිවරු බෝධිය ද බුදුන් ද වැන්දා හ.

ඉසී බොධිං ච බුද්ධං ච වන්දිංසු.

3. නෑයෝ ආගන්තුකයන්ට එළුවන් දුන්හ.

ඤාතයො අත්ථීනං අජෙ දදිංසු.

4. තොපි සිටුවරුන්ගේ ප්‍රාසාදවල කුමක් කළෙහු ද?

තුම්හෙ සෙට්ඨීනං පාසාදෙසු කිං අකරිත්ථ.

5. වධකයා කඩුවෙන් සොරාගේ හිස සින්දේ ය.

වධකො අසිනා චොරස්ස සීසං ඡින්දි.

WWW.PIRIVENA.lk

3. ඔබ උදෑසන පිබිදී කරන ලද ක්‍රියා පහක් යොදා ගෙන අතීත කාල වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

1. අහං මුඛං ධොවිං - මම මුහුණ සේදුවෙමි.
2. අහං පොත්ථකං පඨිං - මම පොත පාඩම් කළෙමි.
3. අහං බුද්ධං වන්දිතුං විහාරං ගච්ඡිං - මම බුදුන් වැඳීමට විහාරයට ගියෙමි.
4. අහං භත්තගගසාලං සම්මජ්ජිං - මම දානශාලාව අතුගෑවෙමි.
5. අහං වච්ඡකුටිං ගන්ත්වා සරීරකිච්චං කරිං - මම වැසිකිළියට ගොස් ශරීරකෘත්‍ය කළෙමි.

4. ක්‍රියාපද දහයක් කාල තුනෙහි පඨම පුරුෂ ඒකවචනයෙහි වරනගා පහත සඳහන් වගුව පුරවන්න.

වර්තමාන කාලය	අනාගත කාලය	අතීත කාලය
පඨති	පඨිස්සති	පඨිංසු
වදති	වදිස්සති	වදිංසු
චරති	චරිස්සති	චරිංසු
ඩසති	ඩසිස්සති	ඩසිංසු
ජිනාති	ජිනිස්සති	ජිනිංසු
රවති	රවිස්සති	රවිංසු
ඛාදති	ඛාදිස්සති	ඛාදිංසු
නච්චති	නච්චිස්සති	නච්චිංසු
බන්ධති	බන්ධිස්සති	බන්ධිංසු
සන්දති	සන්දිස්සති	සන්දිංසු

WWW.PIRIVENA.lk

5. ඔබ කැමති ක්‍රියා මූල (ධාතු) දෙකක් අතීත කාලයේ පුරුෂ තුනෙහි වරනගා අර්ථය ලියන්න.

පුරිස	ඒකවචන	බහුවචන
පඨම පුරිස	අපචි, පචි (ඉව්වේ ය)	අපචිංසු, පචිංසු (ඉව්වෝ ය)
මජ්ඣිම පුරිස	අපචො, පචො (ඉව්වෙහි)	අපචිත්ථ, පචිත්ථ (ඉව්වෙහු)
උත්තම පුරිස	අපචිං, පචිං (ඉව්වෙමි)	අපචිම්හ, පචිම්හ (ඉව්වෙමු)

පුරිස	ඒකවචන	බහුවචන
පඨම පුරිස	අධාවි, ධාවි (දිව්වේ ය)	අධාවිංසු, ධාවිංසු (දිවූහ)
මජ්ඣිම පුරිස	අධාවො, ධාවො (දිව්වෙහි)	අධාවිත්ථ, ධාවිත්ථ (දිව්වෙහු)
උත්තම පුරිස	අධාවිං, ධාවිං (දිව්වෙමි)	අධාවිම්හ, ධාවිම්හ (දිව්වෙමු)

6. මෙම පාඩමේ ඇති ගාථා සිංහලට නගන්න.

මනොපුබ්බඞ්ගමා ධම්මා - මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති - චක්කංව වහතො පදං

WWW.PIRIVENA.lk

ධර්මයෝ සිත පෙරටුකොට ඇත්තාහ. සිත උතුම් කොට ඇත්තාහ. සිතින් උපදනා හෙයින් මනෝමය හ. ඉදින් දූෂිත වූ සිතින් යුක්ත ව (චතුර්විධ වාග් දුශ්චරිතය) කියයි නම් හෝ (ත්‍රිවිධ කාය දුශ්චරිතය) කෙරේ නම් හෝ ඒ හේතුවෙන් (විපාක) දුක්ඛය ඒ පුද්ගලයා අනුව යන්නේ ය. (කුමක් මෙන්ද යත්?) ගැල උසුලන ගොනුන්ගේ පිය අනුව යන ගැල සක මෙනි.

මනොපුබ්බඞ්ගමා ධම්මා - මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන - භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති - ඡායාව අනපායිනී

ධර්මයෝ කර්ම සිත පෙරටු කොට ඇත්තාහ. සිත උතුම් කොට ඇත්තාහ. සිතින් උපදනා හෙයින් මනෝමය හ. ඉදින් ප්‍රසන්නවූ සිතින් කියයි නම් හෝ කෙරේ නම් හෝ ඒ හේතුවෙන් (විපාක) සුඛය ඒ පුද්ගලයා අනුව යන්නේ ය. (කුමක් මෙන්ද යත්?) ශරීරයෙන් පහ නොවන්නා වූ සෙවනැල්ල මෙනි.

අක්කොච්ඡි මං, අවධි මං - අජිනි මං අහාසි මෙ,
යෙ තං උපනය්හන්ති - වෙරං තෙසං න සම්මති

මට ආක්‍රොශ කෙළේය යි ද, මට ගැසීය යිද, මා දිනීය යිද, මා (සතු දෙය) පැහැර ගත්තේ යයි ද, යම් කෙනෙක් ඒ (ක්‍රෝධය) (නැවත නැවත සිත්හි) බඳිත් ද ඔවුන්ගේ ඒ වෛරය නො සන්සිඳෙයි.

අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති - වෙරං තෙසූපසම්මති

මට ආක්‍රෝශ කෙළේය යි ද, මට ගැසීය යි ද, මා දිනීය යි ද, මා (සතු දෙය) පැහැර ගත්තේ යයි ද, යම් කෙනෙක් ඒ (ක්‍රෝධය) (නැවත නැවත සිත්හි) නොබඳිත් ද ඔවුන්ගේ වෛරය සන්සිඳෙයි.

WWW.PIRIVENA.lk

16. 1

1. සිංහලට නගන්න.

1. අයං කුක්කුටො ගාමෙ ජීවති.

මේ කුකුළා ගමෙහි ජීවත් වෙයි.

2. ත්වං ඉමිනා අග්ගිනා ගෙහෙසු පදීපානි ජාලෙසි.

නුඹ මේ ගින්නෙන් නිවසෙහි පහන් දල්වහි.

3. ඉමස්මිං නගරෙ පණ්ණසාලං නත්ථි.

මේ නගරයෙහි පන්සලක් නැත.

4. හත්ථිනො ගෙහෙසු න වසිස්සන්ති.

ඇත්තු නිවාසවල නොවසන්නෝ ය.

5. සාරථිනො අස්සෙ රථෙසු බන්ධිංසු.

රියදුරෝ අශ්වයන් රථවල බැන්දාහ.

2. පාලියට නගන්න.

1. මේ පන්සලේ භික්ෂූහු වාසය කරති.

ඉමස්මිං පණ්ණසාලෙ භික්ඛවො වසන්ති.

2. වඳුරෝ ගස්වල ජීවත් වන්නාහ.

වානරා රුක්ඛෙසු ජීවන්ති.

3. සාගරවල මැණික් ඇත.

සමුද්දෙසු මණී අත්ථි.

WWW.PIRIVENA.lk

4. නැව ගංගාවල ගමන් නොකරයි.

නාවා ගංගාසු න සඤ්චරති.

5. තෝ මේ කඩු රටවල තබහි.

ත්වං ඉමං අසිනො රට්ඨෙසු ඨපෙසි.

3. ඔබ දන්නා නාම පද පහක් යොදා ගෙන සත්තමී විභක්ත්‍යන්ත පදය ඇතුළත් වන සේ වගන්ති පහක් නිර්මාණය කරන්න.

1. සකුණා රුක්ඛෙසු ජීවන්ති
   කුරුල්ලෝ ගස්වල ජීවත් වෙති.
2. තාපසො වනෙ වසති
   තවුසා වනයෙහි වාසය කරයි.
3. ආචරියො පාඨසාලෙ සිස්සෙ විනෙති
   ගුරුවරයා පාසලෙහි ශිෂ්‍යයන් හික්මවයි.
4. වාණිජා සකටෙසු භණ්ඩානි ඨපෙන්ති.
   වෙළෙන්දො කරත්තවල භාණ්ඩ තබති.
5. විහාරෙ උපාසිකායො ධම්මං සුණන්ති.
   විහාරයෙහි උපාසිකාවෝ ධර්මය අසති.

4. පාඩමේ ඇති ඡේදය සිංහලට නගන්න.

- ❖ මනුස්සානං පක්ඛීසු කුක්කුටො උපකාරකො.
  පක්ෂීන් අතරින් කුකුළා මිනිසුන්ගේ උදව්කරුවා වෙයි.
- ❖ තස්මා බහවො මනුස්සා කුක්කුටෙ පොසෙන්ති.
  එහෙයින් බොහෝ මිනිස්සු කුකුළන් පෝෂණය කරති.
- ❖ තෙ ධඤ්ඤකණාදීනි භුඤ්ජන්ති.

WWW.PIRIVENA.lk

උන් ධාන්‍ය කැබලි කති.

❖ දිවා භාගෙ ගෙහස්ස අවිදූරෙ ඉතො චිතො ආහිණ්ඩන්ති.

දහවල් කාලයේ නිවසට නුදුරෙහි එහි මෙහි ඇවිදිති.

❖ සුරියෙ අත්‍ථං ගච්ඡන්තෙ තෙ නිවාසං ආගච්ඡන්ති.

ඉර අවරට යන වේලාවෙහි උන් නිවෙස්නට එති.

❖ රත්තියං රුක්ඛෙසු වා පඤ්ජරෙසු වා සයන්ති.

රාත්‍රියේ ගස්වල ද කූඩුවල ද නිදති.

❖ තෙ සබ්බෙසං ජනානං පඨමතරං පබුජ්ඣිත්වා රවන්ති.

උන් සියලු මිනිසුන්ට පළමුව අවදිවී නාද කරති.

❖ තෙන සද්දෙන මනුස්සා පබුජ්ඣන්ති.

එම ශබ්දයෙන් මිනිස්සු අවදිවෙති.

❖ කාලං ඤත්‍වාය පාතො'ව සකෙ සකෙ කම්මෙ නියුජ්ජන්ති.

කාලය දැන උදෑසනම තම තමන්ගේ කර්මාන්තයන්හි යෙදෙති.

❖ කුක්කුටස්ස සිරසි චූළා වත්තතෙ.

කුකුළාගේ හිසේ කරමලය ඇත.

❖ න තථා කුක්කුටියා සරසි.

කිකිළියගේ හිසේ එසේ නැත.

❖ තතො කුක්කුටියා අධිකතරං කුක්කුටො සොභතෙ.

එහෙයින් කිකිළියට වඩා කුකුළා ශෝභාමත් වේ.

❖ කුක්කුටියා අණ්ඩෙහි සාබකා උප්පජ්ජන්ති.

කිකිළියගේ බිජුවලින් පැටව් ඉපදෙති.

WWW.PIRIVENA.lk

- ❖ කුක්කුටපොතකා කුක්කුටියා සද්ධිං සඤ්චරන්ති.
  කුකුළුපැටව් කිකිළිය සමග ඇවිදිති.
- ❖ අපි නු ත්වං ඉච්ඡසි කුක්කුටෙ පොසෙතුං?
  එහෙයින් නුඹ කුකුළන් පෝෂණය කිරීමට කැමති නො වෙහි ද?

5. අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත ආදී ඔබ මෙතෙක් උගත් සියලු ශබ්දවල වෙනස්කම් හෙඳින් බලා නැවත කියවා පුහුණු වන්න.

WWW.PIRIVENA.lk

17. 1

01. සිංහලට නගන්න.

1. කපයො තරුසු නිසීදිත්වා එලෙහි මනුසෙස පහරිංසු.

වඳුරෝ ගස්වල හිඳ ගෙඩිවලින් මිනිසුන්ට පහර දුන්හ.

2. උපාසකො ධම්මං සුත්වා භික්ඛුං වන්දිත්වා ගෙහං ගන්ත්වා භත්තං භුඤ්ජි.

උපාසකයා ධර්මය අසා භික්ෂුවට වැඳ නිවසට ගොස් ආහාර අනුභව කළේ ය.

3. ගොපාලො පසවෙහි සද්ධිං සින්ධුං ගන්ත්වා සින්ධුම්හි නහායිත්වා පසවො ගහෙත්වා ගෙහං පවිසිත්වා බන්ධුනො ගෙහං ගච්ඡි.

ගොපල්ලා එළුවන් සමග සින්ධු නදියට ගොස් සින්ධු නදියෙන් නා එළුවන් ගෙන නිවසට පිවිස නෑයාගේ නිවසට ගියේ ය.

4. සීහො මිගං මාරෙත්වා ඛාදිත්වා වනං පාවිසි.

සිංහයා මුවා මරා කා වනයට පිවිසියේ ය.

5. අහං කටච්ඡුං ගහෙත්වා භික්ඛුනො පත්තෙ දානං පූජෙත්වා වන්දාමි.

මම හැන්ද ගෙන භික්ෂුවගේ පාත්‍රවලට දානය පුදා වඳිමි.

02. පාලියට නගන්න.

1. ඇත්ගොව්වා පොරොවෙන් ගස් කපා ඇතුන්ට දුන්නේ ය.

WWW.PIRIVENA.lk

හත්ථිපාලකො එරසුනා රුක්ඛෙ ඡින්දිත්වා හත්ථීනං දදි.

2. ගුරුවරු වෙළෙන්දන්ගෙන් කොඩි මිළට ගෙන සිසුන්ට දුන්හ.

ආචරියා වාණිජෙහි ධජෙ කිණිත්වා සිස්සානං දදිංසු.

3. තාපසයා සිටුමැදුරෙහි දානය වළඳා බණ කියා නික්මුණි.

තාපසො සෙට්ඨිමන්දිරෙ දානං භුඤ්ජිත්වා ධම්මං දෙසෙත්වා නික්ඛමි.

4. මුවා සිංහයෙකු දැක බිය වී දුව ගොස් කන්දෙන් පැන්නේ ය.

මිගො සීහං දිස්වා භායිත්වා ධාවිත්වා පබ්බතම්හා ඛන්දි.

5. අපි මල් කඩා විහාරයට ගොස් බුදුන් වැඳ ඤාතීන්ට පින් දෙමු.

මයං පුප්ඵානි ඔචිනිත්වා විහාරං ගන්ත්වා බුද්ධං වන්දිත්වා ඤාතීනං පුඤ්ඤානි දදාම.

03. ඔබ දන්නා ක්‍රියා පද 5ක් සොයා ඒවා පූර්ව ක්‍රියා කර වාක්‍ය බැගින් තනන්න.

❖ ඛාදති - ඛාදිත්වා

බාලකො භත්තං ඛාදිත්වා පාඨාලයං ගච්ඡති

ළමයා බත් කා පාසලට යයි.

❖ ඔචිනාති - ඔචිනිත්වා

දාරිකායො පුප්ඵානි ඔචිනිත්වා බුද්ධං පූජෙන්ති.

දැරියෝ මල් නෙළා බුදුන්ට පුදති.

WWW.PIRIVENA.lk

- ධාවති - ධාවිත්වා

  මිගො මග්ගෙ ධාවිත්වා වනං පවිසති.

  මුවා මාර්ගයෙහි දිවගොස් වනයට පිවිසෙයි.

- ලිඛති - ලිඛිත්වා

  සිස්සො අක්ඛරානි ලිඛිත්වා සයති.

  ශිෂ්‍යයා අකුරු ලියා නිදයි.

- පචති - පචිත්වා

  මාතා ඔදනං පචිත්වා ඛෙත්තං ගච්ඡති.

  අම්මා බත් උයා කුඹුරට යයි.

- කිණාති - කිණිත්වා

  පිතා වත්ථං කිණිත්වා දාරිකං දදි.

  පියා වස්ත්‍රයක් මිළ දී ගෙන දැරියට දුන්නේ ය.

04. ක්‍රියා පද 20ක් පූර්ව ක්‍රියා රූපය සාදා පුහුණුවන්න.

1. ඛාදති - ඛාදිත්වා
2. පචති - පචිත්වා
3. කිණාති - කිණිත්වා
4. භාසති - භාසිත්වා
5. නච්චති - නච්චිත්වා
6. පස්සති - පස්සිත්වා
7. රක්ඛති - රක්ඛිත්වා
8. පඨති - පඨිත්වා
9. ධොවති - ධොවිත්වා
10. රවති - රවිත්වා

WWW.PIRIVENA.lk

11.ඩසති - ඩසිත්වා

12.වදති - වදිත්වා

13.වන්දති - වන්දිත්වා

14.ගච්ඡති - ගන්ත්වා

15.ආගච්ඡති - ආගන්ත්වා

16.වික්කිණාති - වික්කිණිත්වා

17.ඔචිනාති - ඔචිනිත්වා

18.ධාවති - ධාවිත්වා

19.දදාති - දත්වා

20.භායති - භායිත්වා

05. පාඩමේ ඇති ඡේදය සිංහලට නගන්න.

❖ සාවත්ථියං අදින්නපුබ්බකො නාම බ්‍රාහ්මණො අහොසි.

සැවැතෙහි අදින්නපුබ්බක නම් බමුණෙක් විය.

❖ තෙන කස්සචි කිඤ්චි න දින්නපුබ්බං.

ඔහු විසින් කිසිවෙකුට කිසිවක් නොදෙන ලද්දේ විය.

❖ තස්ස එකො'ව පුත්තො අහොසි පියො මනාපො.

ඔහුට ප්‍රිය මනාප එකම පුතෙක් විය.

❖ බ්‍රාහ්මණො පුත්තස්ස පිළන්ධං දාතුකාමො 'සචෙ සුවණ්ණකාරස්ස ආචික්ඛිස්සාමි, වෙතනං දාතබ්බං භවිස්සතී'ති සය'මෙව සුවණ්ණං කොට්ටෙත්වා මට්ඨානි කුණ්ඩලානි කත්වා අදාසි.

WWW.PIRIVENA.lk

බමුණා පුතාට පලඳනාවක් දීමට කැමැත්තේ 'ඉඳින් රන්කරුවාට සැලකරන්නෙම් නම්, වැටුපක් දිය යුතු වන්නේය' යනුවෙනි. තමන්ම රන් කෑල්ලක් තලා මට්ටම් කොට කුණ්ඩලයක් කොට දුන්නේ ය.

❖ තෙන'සස පුතෙතා 'මට්ටකුණ්ඩලී'ති පඤ්ඤායි.

ඒ නිසා ඔහුගේ පුතා 'මට්ටකුණ්ඩලී' යැයි ප්‍රසිද්ධ විය.

❖ තසස සොළසවසසකාලෙ පණ්ඩුරොගො උදපාදි.

ඔහුට දහසය වියේ දී පණ්ඩු රෝගයක් හටගත්තේ ය.

❖ බ්‍රාහමණො වෙජ්ජානං සනතිකං ගනත්වා 'තුමෙහා අසුකරොගසස කිං හෙසජ්ජං කරොථා'ති පුච්ඡි.

බමුණා වෙදුන් සමීපයට ගොස් 'නුඹලා අසවල් රෝගයට කුමන බෙහෙත් කරහුදැ'යි විමසුවේ ය.

❖ තෙ අසස යං වා තං වා රුකඛතචාදිං ආචිකඛිංසු. සො තං ආහරිත්වා හෙසජ්ජං කරි.

ඔවුහු මොහුට යම් ඒ ගස්පොතු ආදිය ප්‍රකාශ කළහ. ඔහු එය ගෙනැවිත් බෙහෙතක් කළේ ය.

❖ තථා කරොනතසෙස'ව තසස රොගො බලවා අහොසි.

එසේ කරන්නේ ඔහුගේ රෝගය බලවත් විය.

❖ බ්‍රාහමණො තසස දුබබලභාවං ඤත්වා එකං වෙජ්ජං පකෙකාසි.

බමුණා ඔහුගේ දුබල බව දැන එක් වෙදෙකු කැඳවීය.

❖ සො තං ඔලොකෙත්වා 'අමහාකං එකං කිච්චං අත්ථි' අඤ්ඤං වෙජ්ජං පකෙකාසිත්වා තිකිච්ඡාපෙහී'ති වත්වා නිකඛමි.

WWW.PIRIVENA.lk

ඔහු (වෙදා) ඔහු (දරුවා) බලා 'අපට එක කටයුත්තක් ඇත' වෙනත් වෙදෙකු කැඳවා බෙහෙත් කරන්නැ'යි කියා පිටත් විය.

WWW.PIRIVENA.lk

18. 1

01. සිංහලට නගන්න.

1. ආම, මයං පුන එවං න කරිස්සාම.

එහෙමයි, අපි නැවත මෙසේ නො කරන්නෙමු.

2. යත්ථ අම්බු හොති තත්ථ පදුමානි ජායන්ති.

යම් තැනෙක ජලය ඇද්ද එහි පියුම් හටගනියි.

3. යාව තව ගාරවො ඉධ ආගච්ඡිස්සන්ති තාව ත්වං ඉධ තිට්ඨාහි.

යම්තාක් නුඹේ ගුරුවරු මෙහි පැමිණෙන්නෝ ද ඒ තාක් නුඹ මෙහි සිටින්න.

4. වාණිජා ගාමම්හා බහි වසිස්සන්ති.

වෙළෙන්දො ගමෙන් පිටත වාසය කරන්නෝ ය.

5. සො ඛිප්පං ධම්මං විජානාති.

ඔහු වහා ධර්මය අවබෝධ කරගනී.

02. පාලියට නගන්න.

1. නුඹලා හෝ අපි හෝ එහි යමු.

තුම්හෙ වා මයං වා තත්‍ර ගච්ඡාම.

2. සමුද්‍රය හාත්පස පර්වතයෝ වෙත්.

සමුද්දෙ සමන්තා පබ්බතා සන්ති.

WWW.PIRIVENA.lk

3. ඉදින් නුඹ එහි යන්නෙහි නම් මම ද නුඹ සමග එන්නෙමි.

සචෙ ත්වං තත්‍ර ගච්ඡිස්සසි අහං ච තයා සද්ධිං ආගච්ඡිස්සාමි.

4. මහණ, පිටවෙන්න යැයි ආලවක යක්ෂයා කීවේ ය.

නික්ඛම සමණ ඉති ආලවක යක්ඛො අවදි.

5. ගවයෝ ගස යට තණ කති.

ගාවායො රුක්ඛ හෙට්ඨා තිණං ඛාදන්ති.

03. ඔබ දන්නා නිපාත පද පහක් යොදා වාක්‍ය පහක් තනන්න.

04. මෙතෙක් ඔබ පාලි භාෂා පොත් ඉගෙනීමේ දී හමු වී ඇති නිපාත පද ලැයිස්තුවක් සාදන්න.

05. පාඩමේ එන ඡේදය සිංහලට නගන්න.

<u>ධාතුසෙනො/ නරිස්සරො - ධාතුසේන රජතුමා</u>

- ❖ පුබ්බෙ අනුරාධපුරං නාම අග්ගනගරං අහොසි.

  පෙර අනුරාධපුර නම් අගනගරයක් විය.

- ❖ තස්මිං නගරෙ මහානාමො නාම මහාථෙරො විහාසි.

  එම නගරයෙහි මහානාම නම් මහතෙර නමක් විසී ය.

- ❖ සො පණ්ඩිතො.

WWW.PIRIVENA.lk

ඔහු පණ්ඩිත ය.

❖ සද්දසත්ථ කොවිදො.

ශබ්ද ශාස්ත්‍රයෙහි දක්ෂ ය.

❖ මෙධාවි ච භවති.

පණ්ඩිතයෙක් ද වෙයි.

❖ තස්මිං නගරෙ දහරො රාජකුමාරො ච විහාසි.

එම නගරයෙහි ළදරු රාජකුමාරයෙක් ද විසී ය.

❖ ධාතුසෙනො නාම තස්ස නාමං.

ධාතුසේන නාමය ඔහුගේ නම ය.

❖ සො කුමාරො අනුදිනං මහාවිහාරං ගච්ඡති.

ඒ කුමාරයා දිනපතා මහාවිහාරයට යයි.

❖ සො පච්ඡා පරොපද්දව භයෙන මහානාමථෙරස්ස සන්තිකෙ පබ්බජි.

ඔහු පසුව සතුරු උවදුරු බියෙන් මහානාම තෙරුන්ගේ සමීපයේ පැවිදි විය.

❖ සො සාමණෙරො එකදා අත්තනො ආචරියෙන සද්ධිං පච්චන්තං අගමි.

ඒ සාමණේර එක්දිනක් තමාගේ ගුරුවරයා සමග පිටිසර පෙදෙසකට ගියේ ය.

❖ ගමනමග්ගෙ එකං කුන්නදිං දිස්වා මහානාම ථෙරො එවමාහ.

ගමන් මාර්ගයෙහි එක් කුඩා ගංගාවක් දැක මහානාම හිමි මෙසේ කීවේ ය.

WWW.PIRIVENA.lk

❖ ''භො සාමණෙර, යදි ත්‍වං අසම්ං දීපෙ රජ්ජං ලභෙය්‍යා තදා එත්‍ථ එකං වාපිං බන්‍ධාපෙහීති.''

'පින්වත් සාමණෙරය, ඉදින් නුඹ මේ දීපයෙහි රජකම ලබන්නේ නම් මෙහි එක වැවක් බඳවන්න' යනුවෙනි.

❖ සො සාමණෙරො පච්ඡා උපපබ්බජිත්‍වා ලඞකාරජ්ජං ලභි.

ඒ සාමණේර පසුව උපැවිදි වී ලංකා රාජ්‍යය ලැබුවේ ය.

❖ සො රාජා අතී'ව ධම්මිකො අත්‍තනො ආචරියස්ස වචනං සරිත්‍වා තත්‍ථ වාපිං බන්‍ධාපෙසි.

ඒ රජතුමා අතිශයින් ධාර්මික ය. තමන්ගේ ගුරුවරයාගේ වචනය සිහිකොට එහි වැවක් බැන්ද වී ය.

❖ අජ්ජ සා වාපි 'කාලවාපී'ති පඤ්ඤායති.

අද ඒ වැව 'කලාවැව' යනුවෙන් ප්‍රසිද්ධ ය.

WWW.PIRIVENA.lk